සියලු ම සටහන් ඇතුළත්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පොස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

64 - දෙවන බස සිංහල

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
අ.පොස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

64 - දෙවන බස සිංහල

ලකුණු ව්‍යුහය

I පත්‍රය :	බහුවරණ ප්‍රශ්න 40 කි.	ලකුණු 40 යි.
II පත්‍රය :	කොටස් තුනකි. ප්‍රශ්න 06න් 05කට උත්තර ලිවිය යුතු ය.	ලකුණු 60 යි.
		එකතුව **100 යි.**

II පත්‍රය

I කොටස	1 ප්‍රශ්නය	ලකුණු 20 යි	**අනිවාර්යයි.**
	2 ප්‍රශ්නය	ලකුණු 10 යි	
II කොටස	3 ප්‍රශ්නය	ලකුණු 10 යි	**ප්‍රශ්න එකයි**
	4 ප්‍රශ්නය	ලකුණු 10 යි	
III කොටස	5 ප්‍රශ්නය	ලකුණු 10 යි	**ප්‍රශ්න දෙක ම**
	6 ප්‍රශ්නය	ලකුණු 10 යි	

අ.පොෂ. (සා.පෙළ) විභාගය - 2023 (2024)
උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පැනක් භාවිතා කළ යුතුය.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) .... √ △ 4/5

(ii) .... √ △ 3/5

(iii) .... √ △ 3/5

03 (i) 4/5 + (ii) 3/5 + (iii) 3/5 → එකතුව □ 10/15

බහුවරණ උත්තරපත්‍ර :

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අදින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත්**

පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර X ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඔවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.

(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

64 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

දෙවන බස - සිංහල I, II
இரண்டாம் மொழி - சிங்களம் I, II
Second Language - Sinhala I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.

Use additional reading time to go through the question paper, select the questions you will answer and decide which of them you will prioritise.

දෙවන බස - සිංහල I இரண்டாம் மொழி - சிங்களம் I Second Language - Sinhala I

උපදෙස්:

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරා ගන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

அறிவுறுத்தல்கள்:

- எல்லா வினாக்களுக்கும் விடை எழுதுக.
- **1** தொடக்கம் **40** வரையுள்ள வினாக்கள் ஒவ்வொன்றிலும். (1), (2), (3), (4) என எண்ணிடப்பட்ட விடைகளில் **சரியான அல்லது மிகப் பொருத்தமான** விடையைத் தெரிவுசெய்க.
- **உமக்கு வழங்கப்பட்டுள்ள விடைத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் உரிய வட்டங்களில் உமது விடையின் எண்ணை ஒத்த வட்டத்தினுள்ளே புள்ளடியை (X) இடுக.**
- அவ்விடைத்தாளின் மறுபக்கத்தில் தரப்பட்டுள்ள மற்றைய அறிவுறுத்தல்களையும் கவனமாக வாசித்து, பின்பற்றுக.

Instructions:

- *Answer **all** questions.*
- *In each of the questions from **1** to **40,** pick one of the alternatives (1), (2), (3), (4) which you consider is **correct or most appropriate.***
- ***Mark a cross** (X) **on the number corresponding to your choice in the answer sheet provided.***
- *Further instructions are given on the back of the answer sheet. Follow them carefully.*

● අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල, **තද කළු අකුරෙන්** මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පද යුගලය තෝරන්න.

1 தொடக்கம் **5** வரையுள்ள வினாக்களில் **தடித்த எழுத்தில்** தரப்பட்டுள்ள சொற்களுக்குப் பதிலாக இடத்தக்க மிகவும் பொருத்தமான சொற்சோடியைத் தெரிவுசெய்க.

Select the most suitable pair of words for the word printed in **bold letters** in questions from No. **1** to **5**.

1. තාත්තේ, **ඔයත්තෙක්ක** මම එන්න ද?
(1) ඔයත්තෙ එක්ක (2) ඔයා එක්ක (3) ඔයත් එක්ක (4) ඔයා තෙක්ක

2. ඔයාගේ උත්සාහය **අතාරින්නෙපා.**
(1) ආතාරින්න එපා (2) අතාරින්න එපා (3) ආතරින් නෙපා (4) අතාරින් එපා

3. අම්මේ, අපි නිවාඩුවට ආච්චි අම්මා බලන්න **යන්නැද්ද**?
(1) යන්න නැද්ද (2) යන්නෑ නැද්ද (3) යන නැද්ද (4) යන්නෙ නැද්ද

4. අලුතෙන් ගස් හිටවන්නෙ නැතිව ගස් **කපන්නෙපා**.
(1) කපන් එපා (2) කපන්නේ එපා (3) කපන්න එපා (4) කපන එපා

5. හවසට වහිටි පුතේ, **කුඩෙත්තරන්** යන්න.
(1) කුඩේ හරන් (2) කුඩෙත් අරන් (3) කුඩෙත් රන් (4) කුඩේ අතරන්

● අංක **6** සිට **10** තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරෙන් **නිවැරදි උච්චාරණය** සහිත උත්තරය තෝරන්න.
6 දොටක්කම් **10** වරෙයාන විනාක්කළිල් තරප්පට්ටුළ්ළ සොර්කළිල් **සරියාන උච්චරිප්පෙයිත්** තරුම් විටෙයෛත් තෙරිවුසෙය්ක.
Select the answer with **correct pronunciation** from the words given in questions from No. **6** to **10**.

6. (1) වතුර මල (2) වදුර මල (3) වතුරු මළ (4) වදුර මළ
7. (1) පත්තර පිටුව (2) පත්තර පිටුව (3) පද්දර පිටුව (4) බද්දර බිටුව
8. (1) බිටකොටුව (2) පිටගොටුව (3) පිටකොටුව (4) බිටගොටුව
9. (1) ග්‍රාමනිලධාරි (2) ක්‍රාමනිලධාරි (3) ග්‍රාමනිලතාරි (4) ගිරාමනිලධාරි
10. (1) කම්පොළ හරහා (2) ගම්පොළ හරහා (3) ගම්බොළ කරහා (4) ගම්පොළ කරහා

● අංක **11** සිට **14** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය සඳහා **වඩාත් ගැළපෙන** ප්‍රශ්නය තෝරන්න.
11 දොටක්කම් **14** වරෙයාන ඔව්වොරු කූට්‍රුක්කුම් **මිකප්පොරුත්තමාන** විනාවෛත් තෙරිවුසෙය්ක.
Select the **most appropriate** question for each statement given from No. **11** to **14**.

11. ගිහාන් ආපසු ගෙදරට ආවේ ය.
(1) ගිහාන් ආපසු ආවේ ඇයි? (2) ගිහාන් ආපසු ආවේ කුමන වෙලාවක ද?
(3) ගිහාන් ආපසු එන්නේ කොහොම ද? (4) ගිහාන් ආපසු ආවේ කොහෙට ද?

12. "ඔයා මැරුණා වගේ ගහ යට නිදාගෙන ඉන්න"
(1) ගහ යට නිදාගෙන ඉන්න කිවුවේ කවුද? (2) ගහ යට නිදාගෙන ඉන්න කිවුවේ කොහොම ද?
(3) ගහ යට නිදාගෙන ඉන්න කිවුවේ ඇයි? (4) ගහ යට නිදාගෙන ඉන්න කිවුවේ කොයි වෙලාවෙ ද?

13. මුළු ඇඟ ම ඉව කරලා බලලා යන්න ගියා.
(1) ඉව කරලා බලලා යන්න ගියේ කවුද?
(2) ඉව කරලා බලලා යන්න ගියේ කොහොම ද?
(3) ඉව කරලා බලලා යන්න ගියේ කොහාට ද?
(4) ඉව කරලා බලලා යන්න ගියේ මොකක් ද?

14. අර දොරටුව ළඟ කවුන්ටරයෙන් ටිකට් ගන්න.
(1) කවුන්ටරයෙන් ගන්න කිවුවේ මොනවා ද? (2) කවුන්ටරයෙන් ගන්න කිවුවේ කවුද?
(3) කවුන්ටරයෙන් ගන්න කිවුවේ කුමන වෙලාවෙ ද? (4) කවුන්ටරයෙන් ගන්න කිවුවේ ඇයි?

● අංක **15** සිට **17** තෙක් ප්‍රශ්නවල **නිවැරදි ව අකුරු** යෙදී ඇති උත්තරය තෝරන්න.
15 දොටක්කම් **17** වරෙයාන විනාක්කළිල් **සරියාන එළුත්තුක්කූට්ටලෛක්** කොණ්ට සොල්ලෛත් තෙරිවුසෙය්ක.
Select the answer with **correct spellings** in questions from No. **15** to **17**.

15. (1) භාණ්ඩාගාරික (2) බාන්ඩාගාරික (3) භාණ්ඩාහාරික (4) භාණ්ඩාකාරික
16. (1) වාර්ෂික (2) වාර්ෂිඛ (3) වාර්ෂීඛ (4) වාර්ෂිඝ
17. (1) කොට්ඨාෂය (2) කොට්ටාසය (3) කොට්ඨාසය (4) කොට්ටාශය

● අංක **18** සිට **20** තෙක් ප්‍රශ්නවල **නොගැළපෙන** පදය තෝරන්න.
18 දොටක්කම් **20** වරෙයාන විනාක්කළිල් **පොරුත්තමර්ර** සොල්ලෛත් තෙරිවුසෙය්ක.
Select the **inappropriate** word in questions from No. **18** to **20**.

18. (1) පාසල (2) විශ්වවිද්‍යාලය (3) පන්සල (4) කාර්මික විද්‍යාලය
19. (1) සුළි සුළං (2) සීතල (3) ගංවතුර (4) භූමිකම්පා
20. (1) මවුලවිතුමා (2) පූජකතුමා (3) විදුහල්පතිතුමා (4) විහාරාධිපති හිමියන්

- අංක **21** සිට **23** තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් දෙන පදය** තෝරන්න.
  21 තොටක්කම් **23** වශයාන විනාක්කලිල් ආරම්පත්තිල් තරප්පට්ට සොල්ලුක්කු ඔත්තකරුත්තෙත් තරුම් සොල්ලෙත් තෙරිවුසෙය්ක.
  Select the **synonym** for the word given at the beginning in questions from No. **21** to **23**.

21. පෙරටරු : (1) උදේ (2) ගවස (3) පසුදින (4) පෙර දින
22. ජලය : (1) වාෂ්ප (2) මීදුම (3) සීතල (4) එතුර
23. නිවස : (1) වහල (2) ගෙදර (3) කුටිය (4) වෙහෙර

- අංක **24** සහ **25** ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් දෙන පදය** තෝරන්න.
  24, 25 ආකිය විනාක්කලිල් ආරම්පත්තිල් තරප්පට්ට සොල්ලුක්කු **එතිර්ක්කරුත්තෙත්** තරුම් සොල්ලෙත් තෙරිවුසෙය්ක.
  Select the **antonym** for the word given at the beginning in questions No. **24** and **25**.

24. සංඛත : (1) සංවහන (2) සමෘද්ධි (3) විවෘත (4) විවිධ
25. ඉහළ : (1) අසල (2) පහළ (3) පෙළ (4) පොළ

- අංක **26** සිට **28** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා **වඩාත් ගැළපෙන අදහස** දැක්වෙන වරණය තෝරන්න.
  26 තොටක්කම් **28** වරෙයාන ඔව්වොරු විනාවිල්ලුම් තරප්පට්ටුල්ල පටත්තුක්කු මිකප් පොරුත්තමාන **කරුත්තෙත්** තරුම් විටෙයෙත් තෙරිවුසෙය්ක.
  Select the option that gives the **most suitable idea** for the picture given in each question from No. **26** to **28**.

26.



(1) ආබාධිත අය ගමන් කිරීම තහනම්
(2) ආබාධිත අය සඳහා පමණි
(3) පාපැදි ගමන් කිරීම තහනම්
(4) පාපැදි තල්ලු කිරීම තහනම්

27.



(1) ගින්නෙන් පරෙස්සම් වන්න
(2) මෙම ස්ථානයෙන් ඉවත් වන්න
(3) වහා ගිනි ඇවිළෙනපුලු ය
(4) ගිනි තැබීම තහනම්

28.



(1) ඉදිරියෙන් පාසලක් ඇත
(2) දෙපේළියට ගමන් කරන්න
(3) මෙතකින් පාර මාරු නොවන්න
(4) පදිකයන් සඳහා පමණි

- අංක **29** සහ **30** ප්‍රශ්නවලට **ගැළපෙන උත්තරය** තෝරන්න.
  29, 30 ආකිය විනාක්කලුක්කුප් **පොරුත්තමාන විටෙයෙත්** තෙරිවුසෙය්ක.
  Select the **suitable answer** for questions No. **29** and **30**.

29. තම අදහසක් වාචික ව ප්‍රකාශ කිරීමේ හැකියාව
(1) ශ්‍රවණය (2) කථනය (3) කියවීම (4) ලිවීම

30. රෝගියෙකු රෝහලට රැගෙන යාමට පෙර දිය හැකි ප්‍රතිකාරයකි
(1) සහනාධාර (2) වෛද්‍යාධාර (3) ප්‍රථමාධාර (4) ජීවනාධාර

1 A වැනි පිටුව බලන්න / பக்கம் 1 A ஐப் பார்க்க / see page 1A

- අංක **31** සහ **32** ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක එක් වාක්‍යයක් ලෙස **නිවැරදි ව** සම්බන්ධ කර **ලියා ඇති වාක්‍යය** තෝරන්න.
  31, 32 ඇතිය විනාක්කලිල් ඉරු වාක්කියങ්කള් තරప్పట్టుళ్ళන. අන්ත ඉරු වාක්කියങ්කළෛයුම් **සරියාක** ඉණෛත්තු ඔරු වාක්කියමාක්කි **එළුතప్పట్టుళ్ళ වාක්කියත්තෛත්** තెරිවුසెయ්ක.
  In questions No. **31** and **32,** two sentences each are given. Select the **sentence** that **correctly** combines the two sentences.

31. මාස හයක ප්‍රායෝගික පුහුණුවක් තියෙනවා. එය සම්පූර්ණ කිරීමෙන් පසු ආයතනයේ රැකියාවක් ලැබෙනවා.
(1) ප්‍රායෝගික පුහුණුව සම්පූර්ණ කළ විට ආයතනයේ රැකියාවක් ලැබෙයි.
(2) ප්‍රායෝගික පුහුණුව සම්පූර්ණ කිරීම නිසා ආයතනයේ රැකියාවක් ලැබෙයි.
(3) ප්‍රායෝගික පුහුණුව සම්පූර්ණ කිරීම හේතුවෙන් ආයතනයේ රැකියාවක් ලැබෙයි.
(4) ප්‍රායෝගික පුහුණුව සම්පූර්ණ කරද්දී ආයතනයේ රැකියාවක් ලැබෙයි.

32. මිනිසා ගහකොළ කපා දමයි. පරිසරය විනාශ කරයි.
(1) මිනිසා ගහකොළ කැපීම නිසා පරිසරය විනාශ කරයි.
(2) මිනිසා ගහකොළ කැපීම සඳහා පරිසරය විනාශ කරයි.
(3) මිනිසා ගහකොළ කැපීමේ දී පරිසරය විනාශ කරයි.
(4) මිනිසා ගහකොළ කපා පරිසරය විනාශ කරයි.

- අංක **33** සහ **34** ප්‍රශ්නවල හිස්තැනට **වඩාත් සුදුසු උත්තරය** තෝරන්න.
  33, 34 ඇතිය විනාක්කලිලුළ්ළ ඉටෛවෙළික්කු **මිකවුම් පොරුත්තමාන සොල්ලෛත්** තెරිවුසెయ්ක.
  Select the **most suitable answer** to fill in each blank in questions No. **33** and **34**.

33. හාමුදුරුවන් වහන්සේ ධර්මශාලාවට ..... සියලු දෙනා ම ආසනවලින් නැඟී සිටියහ.
(1) වඩිනවා (2) වැඩියා (3) වඩිද්දී (4) වැඩියොත්

34. බෙරය ඇතුළේ ආහාර ඇතැයි..... හිවලා බෙරයට ළං විය.
(1) සිතූ (2) සිතුණි (3) සිතුවොත් (4) සිතද්දී

- අංක **35** ප්‍රශ්නයේ **තද කළු** පැහැයෙන් මුද්‍රිත සංඛ්‍යාව නිවැරදි ව අකුරෙන් ලියා ඇති පිළිතුර තෝරන්න.
  35 ඇම් විනාවිල් **තටිත්ත එළුත්තිලුළ්ළ** එණ් සරියාන එළුත්තුකළාල් එළුතప్పట్టుళ్ళ විටෛයෛත් තెරිවුසెయ්ක.
  Select the answer in which the number in **bold** print has been correctly written in letters in question No. **35**.

35. අම්බුළුවාව කදු මුදුන පිහිටා ඇත්තේ මුහුදු මට්ටමේ සිට අඩි **3567** ක උසකිනි.
(1) තුන්දහස් පන්සිය හයසිය හත (2) තුන්සිය පන්දහස් හයසිය හත
(3) තිස් පන්දහස් හයසිය හත (4) තුන්දහස් පන්සිය හැට හත

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.
  36 තොටක්කම් **40** වරෛයාන ඔව්වොරු විනාවිලුම් **ඉලක්කණරීතියාක සරියාන** වාක්කියත්තෛත් තెරිවු සెయ්ක.
  Select the **grammatically correct** sentence in each question from No. **36** to **40**.

36. (1) ඉහත සඳහන් තොරතුරු මම දන්නා පරිදි සත්‍ය බවත් නිවැරදි බවත් ප්‍රකාශ කරමි.
(2) ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය බවත් නිවැරදි බවත් ප්‍රකාශ කළෙමු.
(3) ඉහත සඳහන් තොරතුරු මම දන්නා පරිදි සත්‍ය බවත් නිවැරදි බවත් ප්‍රකාශ කළෝ ය.
(4) ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය බවත් නිවැරදි බවත් ප්‍රකාශ කළාය.

37. (1) නායක හාමුදුරුවෝ මල්ලිට අකුරු කියෙවුවේ ය. (2) නායක හාමුදුරුවෝ මල්ලිට අකුරු කියෙවුවා ය.
(3) නායක හාමුදුරුවන් මල්ලිට අකුරු කියෙවුවෝ ය. (4) නායක හාමුදුරුවෝ මල්ලිට අකුරු කියවූහ.

38. (1) සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටීමට තරුණයෝ කිහිපදෙනෙක් පැමිණ සිටිති.
(2) සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටීමට තරුණයන් කිහිපදෙනෙක් පැමිණ සිටියි.
(3) සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටීමට තරුණයෝ කිහිපදෙනෙක් පැමිණ සිටින්නේ ය.
(4) සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටීමට තරුණයන් කිහිපදෙනෙක් පැමිණ සිටියහ.

39. (1) වෛද්‍යවරිය රෝගියාගේ ඇස් පරීක්ෂා කළෝ ය. (2) වෛද්‍යවරිය රෝගියාගේ ඇස් පරීක්ෂා කළේ ය.
(3) වෛද්‍යවරිය රෝගියාගේ ඇස් පරීක්ෂා කළා ය. (4) වෛද්‍යවරිය රෝගියාගේ ඇස් පරීක්ෂා කළහ.

40. (1) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීහු, ඔවුන්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා දෙති.
(2) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්, ඔවුන්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා දුන්හ.
(3) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීහු, ඔවුන්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා දුන්නේ ය.
(4) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්, ඔවුන්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා දුන්නා ය.

* *

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
க.பொ.த (சா.தர)ப் பரீட்சை – 2023 (2024)

විෂයය අංකය
பாட இலக்கம் **64**

විෂයය
பாடம் **දෙවන බස - සිංහල**

I පත්‍රය - පිළිතුරු
I பத்திரம் - விடைகள்

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.
01.	3	11.	4	21.	1	31.	1
02.	2	12.	2	22.	4	32.	4
03.	4	13.	4	23.	2	33.	3
04.	3	14.	1	24.	3	34.	1
05.	2	15.	1	25.	2	35.	4
06.	1	16.	4	26.	2	36.	1
07.	2	17.	3	27.	3	37.	4
08.	3	18.	3	28.	1	38.	1
09.	1	19.	2	29.	2	39.	3
10.	2	20.	3	30.	3	40.	1

විශේෂ උපදෙස්
විසේෂ අறிவுறுத்தல்

එක් පිළිතුරකට ලකුණු
ஒரு சரியான விடைக்கு **01**

බැගින්
புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව
சரியான விடைகளின் தொகை

25
40

I පත්‍රයේ මුළු ලකුණු
பத்திரம் I இன் மொத்தப்புள்ளி

25
40

64 - දෙවන බස සිංහල

II පත්‍රය

01. ප්‍රශ්නය

අපේක්ෂණ :

i. තෝරා ගත් මාතෘකාවේ සෑම අංශයක් ගැන ම සලකා බලමින්, ඡේද බෙදා කරුණු ගොන හැර දැක්වීම මගින් සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව ප්‍රදර්ශනය කිරීම

ii. එකිනෙකට සම්බන්ධ වන සේ වාක්‍ය ලිවීම

iii. අක්ෂර වින්‍යාසය, විරාම ලකුණු පද බෙදා ලිවීම

iv. ප්‍රකාශන හැකියාව ප්‍රදර්ශනය කිරීම

ඉගෙනුම් පල

- මාතෘකාවට අදාළ කරුණු පෙළ ගස්වයි
- මාතෘකානුකූල රචනා ලියයි

I කොටස / பகுதி I / Part I

1. දී ඇති මාර්ගෝපදේශ ඇසුරු කර ගෙන පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** ගැන **වචන 100**ක පමණ රචනයක් ලියන්න.
පහත දැක්වෙන තලෙප්පුකළුන් ඉන්ත්‍රෙත් තෙරිවුසෙය්තු අතන් කීළේ තරප්පට්ටුන්ල විටයංකළෙ අට්ටප්පටෙයාත කොණ්ටු ඉරත්තාළ **100** සොර්කළිල් අමෙයුමාරු ඔරු කට්ටුරෙ එළුතුක.
Write an essay of about **100 words** on **one** of the following topics using the given guidelines.

(අ) අරපිරිමැස්මට පුරුදු වීමේ අගය
- (i) හැඳින්වීම
- (ii) අරපිරිමැස්මට පුරුදු විය හැකි අයුරු
- (iii) එයට යොමු වීමේ අවශ්‍යතාව
- (iv) ජීවිතයට ලැබෙන ප්‍රයෝජන
- (v) සමාලෝචනය

(ආ) රචනා තරඟයෙන් ජයගත් දා
- (i) හැඳින්වීම
- (ii) රචනා තරඟයේ ස්වභාවය
- (iii) එයට සහභාගි වූ ආකාරය
- (iv) ජයග්‍රහණය ලැබී ඇති වූ සතුට
- (v) සමාලෝචනය

(ඉ) ශ්‍රී ලංකාවේ සුන්දරත්වය
- (i) හැඳින්වීම
- (ii) සුන්දර වීමට බලපාන හේතු
- (iii) සුන්දරත්වය ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව
- (iv) එයින් ලැබෙන ප්‍රයෝජන
- (v) සමාලෝචනය

(ඊ) වන අලි ගමට පැමිණීම
- (i) හැඳින්වීම
- (ii) වන අලි ගමට පැමිණීමට හේතු
- (iii) ගම්වැසියන්ට වන හානි
- (iv) හානි වළක්වා ගැනීමේ මාර්ග
- (v) සමාලෝචනය

(උ) ශිෂ්‍යනායකයන්ට පදක්කම් පැලඳ වූ උත්සවය
- (i) හැඳින්වීම
- (ii) උත්සවය පැවැත්වුණු අයුරු
- (iii) ශිෂ්‍යනායකයකු වීමෙන් ඇති වූ සතුට
- (iv) නිවසේ අය සමග සතුට බෙදා ගත් ආකාරය
- (v) සමාලෝචනය

ලකුණු වූහය

ලකුණු ප්‍රදානයේ දී පහත සඳහන් අංශ හා ඒ පිළිබඳ ව ඇති විස්තර කෙරෙහි අවධානය යොමු කරන්න.

(අ) අදහස් : ලකුණු 06 යි

- මාතෘකාව ගැන පූර්ව්ල් ලෙස සලකා තිබීම
- කරුණුවල සාරවත්භාවය
- ප්‍රමාණවත් බව

(ආ) රචනා රීතිය හා සංවිධානය : ලකුණු 10 යි

- ඡේද බෙදා ලිවීම හා ඒවායේ ගැළපීම
- සුදුසු වචන හා වාක්‍යාංශ යොදා තිබීම
- නිර්මාණාත්මක බව
- නිවැරැදි වචන භාවිතය
- වැරැදි ලෙස ලියා ඇති එක් වචනයකට ලකුණු 1 බැගින් පහක (05) උපරිමයකට සීමා කොට ලකුණු අඩු කරන්න. එක ම වචනය කිහිප තැනක ම වරදවා ලියා ඇතොත් ඒ සියලු වැරැදි එක් වරදක් සේ සලකන්න

(ඇ). ශිල්පීය දක්ෂතා : ලකුණු 04 යි

- ව්‍යාවහාරික සරල වියරණ රීති රැකීම
- පැහැදිලි අත් අකුරු
- පද බෙදා ලියා තිබීම
- විරාම ලකුණු භාවිතය

මේ කරුණු සමස්තයක් වශයෙන් සලකා, ලකුණු තීරණය කරන්න

සැලකිය යුතුය

1. වචන සංඛ්‍යාව 65 - 90 අතරේ ඇති රචනයකට දිය හැකි උපරිම ලකුණු ගණන 15 කි. වචන 50-64 අතරේ ඇති කල්හි දිය හැකි උපරිම ලකුණු ගණන 10 කි. වචන 40-49 අතරේ ඇති කල්හි දිය හැකි උපරිම ලකුණු ගණන 05 කි. වචන 40ට ද අඩු කල්හි අනුපාතික ව ලකුණු දෙන්න.

   ලකුණු දීමේ දී මුලින් දැක්වූ අ, ආ, ඇ, යන කොටස් හැම විට ම සැලකිල්ලට ගත යුතු ය.

2. අ, ආ, ඇ, යන කොටස් සඳහා ලකුණු වෙන වෙන ම දී එකතු කොට ප්‍රශ්නයේ අවසාන ලකුණු $\frac{?}{20}$ යි දක්වන්න.

3. නිවැරැදි හා ගැළපෙන අදහස් ඇති තැන්වල " $\surd$ " ලකුණ ද, වැරැදි අදහස් ඇති තැන්වලට " X " ලකුණ ද යොදන්න. උක්තාඛ්‍යාත සම්බන්ධය වැරැදි තැන්වල යටින් ඉරක් අඳින්න. වැරැදි වචනවල වැරැදි තැන්වලට " ◯ " රවුමක් යොදන්න.

2 ප්‍රශ්නය

අපේක්ෂණය : දෙන ලද පින්තූරයක/ ඡායාරූපයක දැක්වෙන එක් එක් අවස්ථා හා සිද්ධි පිළිබඳ අවධානය යොමු කර ඒවා ලිඛිත බසින් නිවැරැදි ව ලිවීමේ හැකියාව මෙන් ම හැඟීම

ඉගෙනුම් පල : පින්තූර බලා තොරතුරු පැහැදිලි ව ලියයි
අද්දැකීම් ආශ්‍රයෙන් නිර්මාණාත්මක වැකි ලියයි

3. දී ඇති පින්තූරය බලා, ඒ ඇසුරෙන් අර්ථවත් වාක්‍ය **පහක්** ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන **හතරක්වත්** තිබිය යුතු ය.)

தரப்பட்டுள்ள படத்தை அடிப்படையாகக் கொண்டு கருத்துள்ள **ஐந்து** வாக்கியங்களை எழுதுக.
(ஒரு வாக்கியத்தில் குறைந்தபட்சம் **நான்கு** சொற்களாவது இருத்தல் வேண்டும்.)

Compose **five** meaningful sentences with reference to the given picture.
(There should be at least **four** words in a sentence).



II කොටස / பகுதி II / Part II

2 ප්‍රශ්නය - අපේක්ෂිත උත්තර

i. මෙම පින්තූරයේ හතර දෙනෙක් සිටිති.
ii. මෙම පින්තූරයේ වැඩිහිටියෝ දෙදෙනෙක් සහ ළමයි දෙදෙනෙක් සිටිති.
iii. මෙම පින්තූරයේ මව, පියා සහ දරු දෙදෙනෙක් සිටිති.
iv. පින්තූරයේ සිටින හතර දෙනා ගමනක් යමින් සිටිති.
v. මව, සාරියකින් සැරසී සිටියි.
vi. කුඩා ගැහැනු දරුවා ඈත ඇති යමක් පෙන්වයි.
vii. කුඩා ගැහැනු දරුවා අත පාර්සලයක්/ පෙට්ටියක් තිබේ.
viii. පසෙකින් වෑන් රථයක්/ වාහනයක් දර්ශනය වෙයි.
ix. මව සහ පියා කතා කරමින් පාරේ යති.
x. පියා කලිසමකින් සහ කමිසයකින් සැරසී සිටියි.

- පින්තූරයට අදාළ ව ලියා ඇති මේ හා සමාන අදහස් ද පිළිගන්න.
- ලිඛිත භාෂාවෙන් නිවැරැදි වාක්‍ය ලියා තිබීම අවශ්‍ය වේ.
  (එක් වාක්‍යයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10 කි)
- වාක්‍ය කරන බඹින් ලියා ඇත්නම් වාක්‍යයකට ලකුණු 01ක් පිරිනමන්න.
  - ❖ "මෙය ඉතා අලංකාර දර්ශනයකි" වැනි අදාළ නොවන පිළිතුරු සඳහා ලකුණු නොදෙන්න.
  - ❖ මූලින් ලියා ඇති වාක්‍ය 05ක් පමණක් ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 02 x 5 = 10 යි)

3 ප්‍රශ්නය

අපේක්ෂණය - දෙනු ලබන පද්‍ය පාඨයක් කියවා අවබෝධ කර ගැනීමේ හැකියාව මැන බැලීම

ඉගෙනුම් පල : විවිධ ලේඛන අවබෝධයෙන් කියවා තොරතුරු ප්‍රකාශ කරයි : ඉදිරිපත් කරයි

- අංක 3 හා 4 යන ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර සපයන්න.
  3 ආ්ම් 4 ආ්ම් විනාක්කලුළ් ඒතේනුම් **ඔරු** විනොවුක්කු මාත්තිරම් විටෙ එළුතුක.
  Answer only **one** question from questions No. 3 and 4.

3. පහත සඳහන් කවි පෙළ කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
   පින්වරුම් කඛිතෙයෙ වාසිත්තු. කේට්කප්පට්ටුළ්ළ විනාක්කලුක්කු විටෙ එළුතුක.
   Read the following poem and answer the questions given.

මුනි සිරිපා සිඹිමින්	නේ
සමනොළ ගිරි පෙදෙසින්	නේ
මද සුළඟයි මේ එන්	නේ
මගේ පුතා නිදියන්	නේ
දෙව්පුර මෙන් දෙවියන්	නේ
සිරි ලක් දිව් බබළන්	නේ
එහි සක් දෙව් රජු මෙන්	නේ
මගේ පුතා ලොකු වෙන්	නේ
කරදර දහසක් හමු	වී
ඉන්ටැකි නම් සිනා වෙ	වී
ඔහු මෙලොවට පහළ දෙ	වී
රජෙකැයි සලකනු මැන	වී

(i) මෙම කවි පෙළෙන් කවියා අමතන්නේ කාට ද?
(ii) මද සුළඟ එන්නේ කොහි සිට ද?
(iii) සිරිලක් දිව උපමා කොට ඇත්තේ කුමකට ද?
(iv) කරදර බාධක මැද සිනහ විය හැකි තැනැත්තා හඳුන්වා ඇත්තේ කවුරුන් ලෙස ද?
(v) 'ප්‍රදේශයෙන්' යන්නට සමානාර්ථ පදයක් කවි පෙළෙන් උපුටා ලියන්න.

3 ප්‍රශ්නය - අපේක්ෂිත උත්තර

i. පුතාට / මගේ පුතාට
ii. සමනොළ කඳු පෙදෙසින්/ සමනොළ ගිරි පෙදෙසින්නේ/ සමනොළ කඳු පැත්තෙන්
iii. දෙව්පුරයට
iv. රජෙක්/ රජ කෙනෙකුට / දෙව් රජකු
v. පෙදෙසින්

(ලකුණු 02 x 5 = 10 යි)

4 ප්‍රශ්නය

අපේක්ෂණය - **දෙනු ලබන ගද්‍ය පාඨයක් කියවා අවබෝධ කර ගැනීමේ හැකියාව මැන බැලීම**

ඉගෙනුම් පල : **විවිධ ලේඛන අවබෝධයෙන් කියවා තොරතුරු ප්‍රකාශ කරයි, ඉදිරිපත් කරයි**

4. පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் உரைப்பகுதியை வாசித்து, கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Read the following paragraph and answer the given questions.

පාර අයිනේ පුංචි මැටි ගෙයක් තිබුණේ ය. එහි ජීවත් වුණේ විමල් සහ ඔහුගේ නැඟණිය සාමා යන දෙදෙනාත් ඔවුන්ගේ ආත්තම්මාත් පමණි. දෙමවුපියන් නැති ඔවුන් රැකබලාගත් ආත්තම්මා මේ දරු දෙදෙනාට දැඩි සෙනෙහසක් දැක්වූවා ය. ආත්තම්මා ජීවිකාව ගෙන ගියේ පොල් අතු විවීමෙන් සහ කොහු අඹරා ලබා ගත් මුදලිනි. ඔවුන්ට කුඩා ඵළවළු කොටුවක් ද තිබිණි. මේ පුංචි පැලට ආසන්නයේ තිබුණු කුඩා කඳු ගැටය මතුපිට විශාල දෙමහල් මැදුරක් තිබුණේ ය. එහි ජීවත් වූයේ කවුරුන් දැයි මේ අය දැන සිටියේ නැත. මහා මන්දිරය වටා ශක්තිමත් තාප්පයක් බැඳ තිබුණි. කිසිවෙකුටත් තාප්පයෙන් පැනීමට නොහැකි වන ලෙස තාප්පය උඩ උල් බෝතල් කටු සවිකර තිබුණේ ය.

(i) මැටි ගෙදර ජීවත් වූ අය කවුරුන් ද?
(ii) ආත්තම්මා ජීවිකාව ගෙන ගියේ කෙසේ ද?
(iii) දෙමහල් මැදුර පිහිටා තිබුණේ කොහි ද?
(iv) තාප්පය උඩ උල් බෝතල් කටු සවිකර තිබුණේ ඇයි?
(v) 'මැදුර' යන්නට සමානාර්ථ පදයක් ඡේදයෙන් උපුටා ලියන්න.

4 ප්‍රශ්නය - අපේක්ෂිත උත්තර

i. විමල්, සාමා, අත්තම්මා/ විමල් ඔහුගේ නැගණිය සහ අත්තම්මා
(චරිත තුන ම ඇත්නම් ලකුණු 02 යි. චරිත 02 ක් පමණක් ඇත්නම් ලකුණු 01 යි)

ii. පොල් අතු විවීමෙන්, කොහු ඇඹරීමෙන්/ කොහු අඹරා ලබා ගත් මුදලින්
(කරුණු 02 ම ලියා ඇත්නම් ලකුණු 02 යි. එක් කරුණක් ලියා ඇත්නම් ලකුණු 01 යි)

iii. කුඩා කඳු ගැටය මතුපිට/ කඳු ගැටය මතු පිට

iv. කිසිවෙකුටත් තාප්පයෙන් පැනීමට නොහැකි වීමට/ තාප්පයෙන් පැනීමට නොහැකි වීමට

v. මන්දිරය / මාලාන්දිර්ය

5 ප්‍රශ්නය

අපේක්ෂණය - **ප්‍රායෝගික ලේඛන කුසලතා මැන බැලීම**
පරිවර්තන හැකියාව මැන බැලීම

ඉගෙනුම් ඵල : රාජකාරී ලිපියක ආකෘතිය අනුගමනය කරමින් ලිපි ලියයි.
තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලිපි ලියයි.
අවස්ථාව හඳුනාගෙන ලියයි.
අවස්ථාවට ගැළපෙන පරිදි කරුණු නිරවුල් ව පෙළගස්වයි.
නිරවුල් ව හා පැහැදිලි ව අදහස් හුවමාරු කර ගනියි.
දැන්වීම් පත්‍රිකා නිවැරදි ව සකස් කරයි.

5. පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.
பின்வரும் விடயங்களைக் கருத்திற்கொண்டு அறிவித்தலொன்றை தயாரிக்குக.
Prepare a notice based on the following details.

ඔබ පාසල පිහිටුවා වසර 50ක් පිරීම නිමිති කරගෙන ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලෙස පාසලේ පරිසර සංගමයට විදුහල්පතිතුමා උපදෙස් දී ඇත. මේ අනුව සියලු ම පන්තිවලින් පරිසර හිතකාමී ප්‍රදර්ශන භාණ්ඩ රැස් කිරීමට පරිසර සංගමය අදහස් කරයි.

ප්‍රදර්ශනය සම්බන්ධයෙන් පාසල් ශිෂ්‍යයන් දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න.

ඔබේ පාසල රත්මල්ගම මහා විද්‍යාලය ලෙස ද ඔබ පරිසර සංගමයේ ලේකම් සහන් ගුණරත්න යැයි ද සිතන්න.

නැතහොත්
அல்லது
Or

පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන සභාපතිතුමා වෙත යැවීමට සුදුසු රාජකාරී ලිපියක් ලියන්න.
பின்வரும் விடயங்களைக் கருத்திற்கொண்டு தலைவருக்கு உத்தியோகபூர்வ கடிதமொன்றை எழுதுக.
Based on the following facts write an official letter to be sent to chairman.

රත්මල්ගම සමගි මාවතේ පවුල් 25ක් පමණ පදිංචිව සිටිති. නිවාසවලින් බැහැර කරන කුණු කසළ ඉවත් කිරීම නිසි වැඩපිළිවෙලක් මෙතෙක් ක්‍රියාත්මක වී නැත. මේ නිසා නිවැසියන්ට පාරිසරික ප්‍රශ්නවලට ද සෞඛ්‍ය ප්‍රශ්නවලට ද මුහුණ දීමට සිදු වී ඇත. ඔවුන් මුහුණ දී ඇති අපහසුතා විස්තර කරමින් කඩිනමින් විසඳුම් ලබාදෙන ලෙස ඉල්ලමින් රත්මල්ගම ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත යැවීම සඳහා ලිපියක් සකස් කරන්න.

I. දැන්වීම් පත්‍රිකාව ලකුණු 10 යි

1.	ආකෘතිය	-	ලකුණු 04
2.	අන්තර්ගතය	-	ලකුණු 04
3.	ශිල්පීය දක්ෂතා	-	ලකුණු 02
(1)	ආකෘතිය	-	ලකුණු 04
	* මාතෘකාව	-	ලකුණු 01
	* පළ කරන්නා	-	ලකුණු 01
	* පළ කරන දිනය	-	ලකුණු 01
	* නිර්මාණශීලිත්වය	-	ලකුණු 01

(2) අන්තර්ගතය - ලකුණු 04

* ප්‍රදර්ශනය පැවැත්වීමේ අරමුණ (පාසල පිහිටුවා වසර 5ක් සපිරීම) - ලකුණු 01 යි
* පන්තිවලින් සිදු කළ යුතු කාර්යය - ලකුණු 01 යි
* ප්‍රදර්ශනය පැවැත්වෙන ස්ථානය - ලකුණු 01 යි
* ප්‍රදර්ශන භාණ්ඩ ලබා දිය යුතු දිනය - ලකුණු 01 යි

(3) ශිල්පීය දක්ෂතා - ලකුණු 02

ව්‍යවහාරික සරල වියරණ රීති රැකීම, පැහැදිලි අත් අකුරු, පද බෙදා ලිවීම, විරාම ලක්ෂණ භාවිතය ආදි කරුණු සමස්තයක් ලෙස සලකා ලකුණු තීරණය කරන්න.

5. **රාජකාරී ලිපිය - ලකුණු 10 යි.**

(1) ආකෘතිය - ලකුණු 04
(2) අන්තර්ගතය - ලකුණු 04
(3) ශිල්පීය දක්ෂතා - ලකුණු 02

} ***මුළු ලකුණු 10 යි.***

(01) ආකෘතිය - ලකුණු 04

* යවන්නාගේ ලිපිනය සහ දිනය ලකුණු 01 යි.
* ලබන්නාගේ තනතුර හා ලිපිනය ලකුණු 01 යි.
* මාතෘකාව ලකුණු 01 යි.
* අවසානය (අත්සන) ලකුණු 01 යි.

(ආ) අන්තර්ගතය - ලකුණු 04

* රත්මල්ගම කුණු කසළ ගැටලුව (ලකුණු 01 යි.)
* නිවැසියන් මුහුණ දෙන ගැටලු (ලකුණු 02 යි.)
* විසඳුම ලබා දෙන ලෙස කරන ඉල්ලීම (ලකුණු 01 යි.)

(ඇ) ශිල්පීය දක්ෂතා - ලකුණු 02

ව්‍යවහාරික සරල වියරණ රීති රැකීම, පැහැදිලි අත් අකුරු, පද බෙදා ලිවීම, විරාම ලක්ෂණ, භාවිතය ආදි කරුණු සමස්තයක් ලෙස සලකා ලකුණු තීරණය කරන්න.

6 ප්‍රශ්නය

අපේක්ෂණය : **පරිවර්තන හැකියාව මැන බැලීම**

ලකුණ් පල : අවශ්‍යතාවලට ව සංවාදවලට ඇතුළත් වෙයි.
සරල ව්‍යුහද සංවාදවල යෙදෙයි.

---

b. පහත දැක්වෙන වදන් / ඉංග්‍රීසි වාක්‍ය **සිංහලට** පරිවර්තනය කරන්න.
கீழே தரப்பட்டுள்ள தமிழ் / ஆங்கில வாக்கியங்களை **சிங்களத்தில்** மொழிபெயர்க்க.
Translate the following Tamil / English sentences into **Sinhala**.

(i) நான் நூல் நிலையப் அங்கத்துவத்தைப் பெற்றுக்கொண்டேன்.
I got the membership of the library.

(ii) சிறுவர்கள் விளையாடுவதற்காக மைதானத்தில் ஒன்று கூடினார்கள்.
Children gathered on the ground to play.

(iii) நாம் சந்துனிக்கு பிறந்தநாள் வாழ்த்தட்டை ஒன்றைத் தயாரிப்போம்.
Let us make a birthday card for Sandun.

(iv) நாம் யால தேசியப் பூங்காவைப் பார்வையிடச் சென்றோம்
We went to see the Yala National Park.

(v) நாம் கண்காட்சியொன்றை நடத்தவுள்ளோம்.
We are going to hold an exhibition.

නැතහොත්
அல்லது
Or

පහත සඳහන් තොරතුරු පදනම් කර ගත සංවාදයක් ලියන්න. (වාක්‍ය **10ක්** ප්‍රමාණවත් වේ.)
பின்வரும் தகவல்களை அடிப்படையாகக் கொண்டு உரையாடல் ஒன்று எழுதுக. (**10** வாக்கியங்கள் போதுமானவை.)
Write a dialogue based on the following information. (**10** sentences are enough.)

ඔබේ ගමේ රැකියා නොකරන කාන්තාවන් සඳහා පන් ආශ්‍රිත නිෂ්පාදන සකස් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීමටත් ඉන් අනතුරුව ඔවුන් යකඩ් කරන භාණ්ඩ සඳහා වෙළඳපොළක් සකසා දීමටත් ගමේ ප්‍රජා සංවර්ධන සමිතිය තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් විස්තර දැන ගැනීමට සංගමයේ ලේකම් සමග ඔබ කරන සංවාදය ලියන්න. ඒ සඳහා පහත කරුණු උපයෝගී කරගන්න.

- සංගමයේ ලේකම් මුණ ගැසීම හා යුතු පැහීම
- අදාළ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම
- සමුගැනීම

i. මම පුස්තකාලයේ සාමාජිකත්වය ගතිමි./ ලබා ගත්තෙමි./ ලබා ගතිමි.

ii. ළමයි ක්‍රීඩා කිරීම සඳහා පිට්ටනියට රැස්වූහ./ එකතු වූහ./ එකතු වුණෝය./ රැස් වුණෝ ය.

iii. අපි සඳුනිට උපන් දින සුබ පැතුම් පතක් හදමු/ හදන්නෙමු.

iv. අපි යාල ජාතික උද්‍යානය බැලීමට ගියෙමු./ බලන්නට ගියෙමු/ නැරඹීමට ගියෙමු.

v. අපි ප්‍රදර්ශනයක් පැවැත්වීමට සූදානම් වෙමු./ පවත්වන්නෙමු./ පැවැත්වීමට යන්නෙමු.

(ලකුණු 10 යි

- මෙම අදහස් දැක්වෙන ලෙස ලියා ඇති වෙනත් පිළිතුරු ද පිළිගන්න. වාක්‍යවල උක්තාබ්‍යා සම්බන්ධය නිවැරදි විය යුතු ය. අක්ෂර විත්‍යාසයේ වැරදි නොසලකා හරින්න
- සම්පූර්ණ වාක්‍යය ම නිවැරදි ව ලියා ඇත්නම් ලකුණු 02ක් ද අදහස පමණක් ලියා ඇත්නම් ලකුණු 01ක් ද පිරිනමන්න.

නැතහොත්

- **නිලධාරියා මුණ ගැසීම හා සුබ පැතීම**
  - * ඔබ — ලකුණු 01
  - * ලේකම් — ලකුණු 01

- **තොරතුරු සාකච්ඡා කිරීම**
  - * වැඩමුළුව පිළිබඳ විමසීම — ලකුණු 01
  - * ඒ පිළිබඳව පැහැදිලි කිරීම — ලකුණු 01
  - * වෙළඳ පොළ සකස් කර ගන්නා ආකාරය විමසීම — ලකුණු 01
  - * වැඩමුළුවට සම්බන්ධ වන ආකාරය විමසීම — ලකුණු 01
  - * ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම — ලකුණු 02

- **සමුගැනීම**
  - * ඔබ — ලකුණු 01
  - * ලේකම්වරයා — ලකුණු 01